Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

7 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.

01 උතුරු අක්ෂාංශ 23.5º (23½) රේඛාව ................................................ නමින් හඳුන්වයි.
(මකර නිවර්තනය / කර්කටක නිවර්තනය / සමකය)

02 පෘථිවි පෘෂ්ඨයෙන් 29% ක් ................................................ ප්‍රදේශ වේ.
(ගොඩබිම් / ජලතල / වනාන්තර)

03 සෑම වෙරළබඩ රාජ්‍යයකටම ලබා දී ඇති නාවික සැතපුම් 12 ක මුහුදු සීමාව ................................................ ලෙස හඳුන්වයි.
(රාෂ්ට්‍රීය මුහුද / යා බද මුහුද / පරම ආර්ථික කලාපය)

04 නිතර ජල ගැලීම් වලට ලක්වන ................................................ කොළඹ - ගම්පහ දිස්ත්‍රික්ක වෙන් කරමින් ගලා බසී.
(දැදුරු ඔය / කැලණි ගඟ / කළු ගඟ)

05 හින්දු ආගමික පූජ්‍යස්ථානයක් වන ................................................ යාපන අර්ධද්වීපයේ පිහිටා ඇත.
(කෝනේෂ්වරම් කෝවිල / මඩු දේවස්ථානය / නල්ලූර් කෝවිල)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06 පෘථිවි ආදර්ශ ගෝලය වටා දේශාංශ රේඛා 360 ක් විහිදී තිබේ. (..........)

07 ශ්‍රී ලංකාවේ දෙවුන්දරතුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා උපරිම දිග 224km කි. (..........)

08 කලපු සහ ගංගා මෝය ආශ්‍රිත ප්‍රදේශවල කටු පඳුරු සහිත වන ලැහැබ් පිහිටා තිබේ. (..........)

09 සිංහරාජ වනාන්තරය ශ්‍රී ලංකාවේ ස්වාභාවික ලෝක උරුමයකි. (..........)

10 ඕනෑම සිතියමක දිශාව දක්වන සටහන යොදා තිබීම අත්‍යවශ්‍ය වේ. (..........)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 තෙත් කලාපය හා වියළි කලාපය වෙන් කෙරෙන ගංගා දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මල්වතු ඔය හා දැදුරු ඔය (2) දැදුරු ඔය හා වලවේ ගඟ

(3) මහවැලි ගඟ හා දැදුරු ඔය (4) කලා ඔය හා වලවේ ගඟ

12 ශ්‍රී ලංකාවේ නායයෑම් බහුලව සිදුවන දිස්ත්‍රික්කයකි,

(1) කෑගල්ල (2) කුරුණෑගල (3) ගම්පහ (4) අම්පාර

13 නූතන සමාජයට අනුවර්තනය වන ආදිවාසීන් ජීවත් වන්නේ මින් කවර ප්‍රදේශයක ද?

(1) මහියංගනය (2) බිම්තැන්න (3) හෙන්නානිගල (4) දඹාන

14 අධික වර්ෂාපතනය නිසා නිතර ජලගැලීම් හා නායයාම් හේතුවෙන් නිරතුරුව වෙනස්වන භූ දර්ශනය වන්නේ මින් කුමක් ද?

(1) වියළි කලාපීය භූ දර්ශනය (2) තෙත් කලාපීය භූ දර්ශනය

(3) වෙරළ ආශ්‍රිත භූ දර්ශනය (4) කඳුකර භූ දර්ශනය

15 බ්‍රිතාන්‍ය දූපත් අයත් වන්නේ මෙම මහද්වීපයටයි,

(1) යුරෝපා මහද්වීපය (2) අප්‍රිකා මහද්වීපය

(3) අසියා මහද්වීපය (4) උතුරු ඇමරිකා මහද්වීපය

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16 පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස සැලකුවද එය ........................................................................ නොවේ.

17 අක්ෂාංශ හා දේශාංශ අනුව රටක පිහිටීම දැක්වීම ..................................................................... ලෙස හඳුන්වයි.

18 ශ්‍රී ලංකාවට බලපෑ ඉතා බිහිසුණු සුනාමි ආපදාව .................................................... දෙසැම්බර් 26 දින සිදු විය.

19 ශ්‍රී ලංකාවේ ඇති ලෝක උරුම, මානව නිර්මිත හා ................................................ ලෙස කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.


20 ශ්‍රී ලංකාව .................................................................. කලාපයේ පිහිටි රටකි.

**7 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව - II කොටස**

සැලකිය යුතුයි


- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (1) පහත සඳහන් ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




1. ආසියා මහද්වීපය දැක්වෙන අක්ෂරය .................................................................................................... වේ.
2. E - E රේඛාවෙන් දැක්වෙන අක්ෂාංශ රේඛාව ............................................................................................ වේ.
3. F අක්ෂරයෙන් දැක්වෙන දූපත් ......................................................................................... දූපත් ලෙස හඳුන්වයි.
4. B අක්ෂරයෙන් දැක්වෙන්නේ ............................................................................................................... ප්‍රදේශයයි.
5. C අක්ෂරයෙන් දැක්වෙන මුහුද ................................................................................................................... මුහුදයි.
6. ලොව විශාලතම සාගරය වන පැසිපික් සාගරය ........................................................... අක්ෂරයෙන් දැක්වේ.
7. L අක්ෂරයෙන් දැක්වෙන දේශාංශ රේඛාව ...................................................................................... දේශාංශයයි.
8. ලොව කුඩාම මහද්වීපය ............................................................................... අක්ෂරයෙන් දැක්වේ. (ල.08)


(2) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




1. E අක්ෂරයෙන් දැක්වෙන තුඩුව .................................................... තුඩුවයි. (ල.01)
2. F අක්ෂරයෙන් දැක්වෙන්නේ ........................................................... දූපතයි. (ල.01)
3. G අක්ෂරයෙන් දැක්වෙන්නේ මෙරට දර්ශනීය වෙරළ තීරයක් වන .............................. වෙරළ තීරයයි. (ල.01)
4. C අක්ෂරයෙන් දක්වා ඇති ප්‍රදේශයට බහුලවම ඇතිවන ආපදා තත්වය වන්නේ ...................................... යි. (ල.01)
5. මෙහි දැක්වෙන A හා B ස්ථාන අයත් වන භූ විෂමතා කලාප ලියා දක්වන්න. (ල.02)
6. J වලින් දැක්වෙන ප්‍රදේශයේ පවතින සුවිශේෂී දේශගුණික ලක්ෂණ 02 ක් දක්වන්න. (ල.02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

02 ශ්‍රී ලංකාවේ කඳුකර භූ දර්ශනයේ පින්තූරයක් පහත සිතියමේ දක්වා ඇත.




(i) මෙම සිතියමේ පිදුරුතලාගල සහ නමුණුකුල කඳුවැටි දක්වෙන අක්ෂර දෙක නම් කරන්න. (ල.02)

(ii) මෙම සිතියමෙහි දක්වා ඇති, E හා F වලින් දක්වෙන සානු දෙක

G - වලින් දක්වෙන නගරය

H - වලින් දක්වෙන දුර්ගය

K - වලින් දක්වෙන දිය ඇල්ල නම් කරන්න. (ල.05)

(iii) මෙම සිතියමින් දක්වා ඇති ප්‍රදේශයේ සිදු කෙරෙන වගාවන් දෙකක් ද දේශගුණික ලක්ෂණ දෙකක් ද දක්වන්න. (ල.04)

03 (i) පහත දැක්වෙන ක්‍රියාවලීන් තුළින් දේශගුණික වෙනස්වීම් ඇතිවීමට දායක වන හේතු 3 ක් තෝරා ලියන්න. (ල. 03)


අධික ඉන්ධන දහනය, පානීය ජල දූෂණය, වෙරළ ඛාදනය, වායුගෝලීය උණුසුම් වීම, ගිනිකඳු පිපිරීම, කෘෂි ඵලදාව අඩුවීම, ජීවිත හා දේපල හානි සිදුවීම, වන විනාශය සිදුකිරීම, වෙරළබඩ කර්මාන්ත විනාශ වීම, ජල හිඟය, බෝවන රෝග වැඩිවීම

(ii) දේශගුණික වෙනස්වීම් මගින් ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම් 4 ක් ඉහත සිදුවීම් තුළින් තෝරා ලියන්න. (ල. 04)

(iii) පහත සඳහන් ස්වාභාවික ආපදාවන් අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් ලියා දක්වන්න.

- නියඟ
- ගංවතුර (ල. 04)


04 (i) පහත දැක්වෙන ලංකා සිතියමේ අංක 1, 2, 3, 4 න් දක්වා ඇති දිස්ත්‍රික්ක නම් කර ඒවා ආශ්‍රිතව බහුලවම සිදුවන ස්වභාවික ආපදා එක බැගින් නම් කරන්න. (ල.04)




(ii) පහත A, B, C රූප සටහන්වලින් දක්වා ඇති ස්වාභාවික උපද්‍රව හඳුනාගෙන නම් කරන්න. (ල.03)



A



B




C

(iii) පහත දක්වා ඇත්තේ මානුෂ ක්‍රියාකාරකම් කීපයකි. ඒවා නිසා සිදුවන පාරිසරික හානි එක බැගින් ලියා දක්වන්න. (ල.04)

- කඳු ප්‍රදේශවල කැලෑ ගිනි ගැනීම.
- පහත් බිම් ගොඩ කිරීම.
- සැලසුමකින් තොරව ඉදිකිරීම් සිදුකිරීම.
- ජලයට අපද්‍රව්‍ය මුසු කිරීම.

05 පහත දකුණු ආසියා කලාපය දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) දකුණු ආසියා කලාපීය රටවල් අතර විශාලතම රට දැක්වෙන අක්ෂරය කුමක්ද? (ල.02)

(ii) මෙම රටවල් අතරින් සාක්ෂරතාවය ඉහළම අගයක් ගන්නා රට දැක්වෙන අක්ෂරය ලියා එම රට නම් කරන්න. (ල.02)

(iii) ළදරු මරණ අනුපාතිකය ඉහළ අගයක් ගන්නා රට B අක්ෂරයෙන් දැක්වේ. එම රට නම් කරන්න. (ල.02)

(iv) ආයු අපේක්ෂාව ඉහළ අගයක් ගන්නා රට G අක්ෂරයෙන් දැක්වේ. එම රට නම් කරන්න. (ල.02)

(v) ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ඉහළ අගයක් ගැනීමට බලපාන හේතු 03 ක් ලියන්න. (ල.03)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 පහත දැක්වෙන උපකාරක පද ඇසුරින් දී ඇති ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

(1) පෘථිවි ආදර්ශ ගෝලයේ බටහිර සිට නැගෙනහිරට ඇඳ ඇති මනඃකල්පිත රේඛා මේ නමින් හඳුන්වයි.

(2) අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව මේ නමින් හඳුන්වයි.

(3) ශ්‍රී ලංකාවේ දිග කොළඹ සිට මෙම තුඩුව දක්වා ගණනය කර ඇත.

(4) සංස්කෘතික උරුම අතර මානව නිර්මිත ආගමික පූජා නගරයකි.

<u>පහළට</u>

(5) පෘථිවිය භ්‍රමණය වන්නේ මෙය වටාය.

(6) ගොඩබිම්, සාගර යනාදිය පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම මේ නමින් හඳුන්වයි.


(7) මධ්‍යම කඳුකරයේ පිහිටි ප්‍රධාන කඳු වැටියකි.

(8) ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික ආපදාවකි.

(9) මධ්‍යම කඳුකරයේ ඇති භූ විෂමතා ලක්ෂණයකි.

(10) වළාකුලක් තුළ ඇතිවිය හැකි විද්‍යුත් ක්‍රියාකාරිත්වය මත ප්‍රතිවිරුද්ධ ආරෝපණ දෙකක් අතර සිදුවන විදුලිය මුදා හැරීම මේ නමින් හඳුන්වයි.

(11) ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ප්‍රදේශයකි.




(ල.11)

07 (i) සිතියම් පරිහරණය පිළිබඳ තොරතුරු කිහිපයක් මෙහි දක්වා තිබේ. ඒවා නිවැරදි පරිදි අදාල කොටුවට යා කරන්න. (ල.07)

1. ඡායා පිටපත් ගැනීම
2. 1 : 50000
3. සිතියමේ ස්ථානවල පිහිටීම හඳුනාගැනීම
4. ට්‍රේසිං කඩදාසියක් යොදා ගැනීම
5. භූ විෂමතාව හා ජලවහනය
6. සිතියමේ කොටු දැල අනුව පිහිටීම
7. සම්මත සංකේත

| | |
|---|---|
| A | සිතියමක් පිටලස් කිරීම |
| B | සිතියමක පරිමාණය |
| C | සිතියමක දිශාව |
| D | සිතියමක සූචිය |
| E | සූචකය |

(ii) සිතියම් මත පරිමාණය හා දිශාව දැක්වීමෙන් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න. (ල.04)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) කර්කටක නිවර්තනය (02) ගොඩබිම් (03) රාජ්‍යීය මුහුද (04) කැළණි ගඟ
(05) නල්ලූර් කෝවිල (06) ✓ (07) × (08) × (09) ✓ (10) ✓
(11) දැදුරු ඔය හා වලවේ ගඟ (12) කෑගල්ල (13) හෙන්නාගිගල (14) තෙත් කලාපීය භූ දර්ශනය
(15) යුරෝපා මහද්වීපය (16) පූර්ණ ගෝලයක් (17) නිරපේක්ෂ පිහිටීම (18) 2006
(19) ස්වභාවික නිර්මිත (20) නිවර්තන

(2 x 20 = 40)

## II කොටස

01 (1) 1. A 2. සමකය 3. බ්‍රිතාන්‍ය දූපත් 4. බෙංගාල බොක්ක
5. රතු මුහුද 6. K 7. ග්‍රිනිච් මධ්‍ය දේශාංශය 8. D (ල.08)

(2) 1. පේදුරු තුඩුව (ල.01) 2. කයිට්ස් (ල.01) 3. හික්කඩුව (ල.01) 4. නියඟය (ල.01)
5. A - වෙරළබඩ තැන්න B - අඩතැන්න (ල.02)
6. අධික උෂ්ණත්වය, වර්ෂාව අඩුය, සුළං අධිකය (ල.02)

02 (i) B හා D (ල.02)
(ii) E - හැටන් F - වැලිමඩ H - ගලගෙදර
G - මහනුවර K - දුන්හිද (ල.05)
(iii) වගා - තේ, රබර්, මල්, පළතුරු (සිසිල් දේශගුණය, ආද්‍රතාවය අධික වීම, මීදුම) (ල.04)

03 (i) අධික ඉන්ධන දහනය, වායුගෝලය උණුසුම් වීම, ගිනිකඳු පිපිරීම, වනාන්තර විනාශ කිරීම, වායුගෝලය උණුසුම් වීම (ල. 03)
(ii) ඉහත කරුණු හැර ඉතිරි ඒවාට ලකුණු දෙන්න. (ල. 04)
(iii) නියඟ හා ගංවතුර අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 2 බැගින් ලිවීමට (ල. 04)

04 (i) 1. පුත්තලම - නියඟ 2. රත්නපුර - ගංවතුර
3. කෑගල්ල - නාය යෑම 4. වව්නියාව - සුළි කුණාටු (ල.04)
(ii) නාය යෑම, ගංවතුර, සුනාමි (මේවා නිසා සිදුවන පාරිසරික බලපෑම් දැක්වීම. (ල.03)
(iii)
- නාය යාම, ජලාශ ගොඩවීම, ජලය හිඟවීම
- නියඟය, ජල මාර්ග අවහිරවීම ආදිය
- ගංවතුර උපද්‍රව, ජල මාර්ග අවහිර වීම ආදිය
- ජලය දූෂණය, බීමට ගන්නා ජලය හිඟ වීම (ල.04)

05 (i) A (ල.02) (ii) G - මාලදිවයින (ල.02) (iii) පාකිස්ථානය (ල.02) (iv) මාලදිවයින (ල.02)
(v) නොමිලේ පාසල් අධ්‍යාපනය ලබාදීම / නොමිලේ නිල ඇඳුම්, පොත්පත් ලබාදීම / ඉගෙනුම් අවස්ථා තිබීම වැනි.... (ල.02)

06 <u>හරහට</u>
(1) අක්ෂාංශ (2) සාක්ෂරතාවය (3) සංගමන් කන්ද (4) කතරගම
<u>පහළට</u>
(5) අක්ෂය (6) සාපේක්ෂ පිහිටීම (7) සමනල (8) ගංවතුර
(9) කපොල්ල (10) අකුණු සැර (11) කටුනායක

07 (i) 1. A 2. B 3. C 4. A
5. D 6. E 7. D (ල.07)
(ii) ප්‍රයෝජන දැක්වීම (ල.04)